ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

විෂයමාලා න්‍යාය හා පරිචය - ESU3115

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.02 වේලාව - ප.ව.02.00 - ප.ව.05.00 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 'විෂයමාලාව' යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. විෂයමාලා සංවර්ධන ආකෘතියක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර එහි වැදගත්කම දක්වන්න.

03. විෂයමාලා ඇගයුම් කරන්නකු සතු වියයුතු ලක්ෂණ පහක් (05) දක්වන්න.

04. සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා විසින් 1938 දී හඳුන්වා දුන් මධ්‍ය විද්‍යාල විෂයමාලාවේ වැදගත්කම අගයන්න.

05. "විෂයමාලා කළමනාකරණය" යන පදය නිර්වචනය කර විෂයමාලා කළමනාකරණයේ අවස්ථා තුනක් (03) සඳහන් කරන්න.

06. ඉන්දියාවේ අධ්‍යාපන පර්යේෂණ හා පුහුණු කිරීම් පිළිබඳ ජාතික කවුන්සලය මගින් ප්‍රසිද්ධියට පත් කර ඇති විෂයමාලා සංවිධානය සඳහා වැදගත් වන මූලධර්ම තුනක් (03) දක්වා ඉන් එකක (01) වැදගත්කම අගයන්න.

07. සැඟවුණු විෂයමාලාව සහ ශාස්ත්‍රීය විෂයමාලාව යන පද වෙන්කොට දක්වන්න.

08. විෂයමාලා ඇගයීම් ක්‍රියාවලියේ ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

( ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) ටයිලර් (Tyler) විසින් සඳහන් කර ඇති විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේ පියවර හතර (04) ලේඛණගත කරන්න. (ලකුණු 08)

(iii) විෂයමාලා පරමාර්ථ සහ අරමුණු තීරණය කරනු ලබන නිර්ණායක හතරක් (04) සඳහන් කර ඉන් එක් (01) නිර්ණායකයක වැදගත්කම අගයන්න. (ලකුණු 08)

10. (i) විෂයමාලාව වෙත විශේෂ අවධානය යොමු කරමින් "අවශ්‍යතා" හා "සංවිධාන" යන පදයන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම යනු කුමක්දැයි විෂයමාලා ඇගයීම් ක්‍රියාවලියට අදාළව පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) විෂයමාලා ඇගයීම් උපකරණ හතරක් (04) දක්වා එම ඇගයීම් උපකරණවල තිබිය යුතු ලක්ෂණ තුනක් (03) පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. (i) ශ්‍රී ලංකාවේ පැරණි යුගයේ පැවති විෂයමාලාවල වැදගත්කම අගයන්න. (ලකුණු 04)

(ii) හන්දෙස්ස අධ්‍යාපන ක්‍රමය ගැන කෙටියෙන් පැහැදිලි කර එම අධ්‍යාපන ක්‍රමයේ ප්‍රබලතා හා දුබලතා පිළිබඳ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) 2007 වසරේ දී සිදු කරනු ලැබූ විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ජොෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා වූ විෂයමාලා ප්‍රතිසංස්කරණවල වැදගත්කම විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

12. (i) විෂයමාලා සංවර්ධනය ආකෘතියක අවශ්‍යතාව කුමක් ද? (ලකුණු 04)

(ii) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියේ අරමුණු තීරණය කිරීමේ දී යොදා ගන්නා මූලාශ්‍ර හතරක් (04) දක්වා අරමුණු තීරණය කිරීමට එහි ඇති වැදගත්කම පහදන්න. (ලකුණු 08)

(iii) ස්කිල්බෙක්ගේ (Skillbeck's) විෂයමාලා සංවර්ධන ආකෘතිය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 08)

13. (i) මනෝවිද්‍යාව හා විෂයයන් අතර සම්බන්ධතාව සැකවින් දක්වන්න. (ලකුණු 05)

(ii) බෲනර්ගේ (Bruner) අදහස් විෂයමාලා සැකසීමේ දී වැදගත්වන අයුරු විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii) ගෙස්ටෝල්ට් (Gestalt) න්‍යාය කෙටියෙන් පැහැදිලි කර එය විෂයමාලා සැලසුම් කිරීමට උපයෝගී කරගත හැකි අයුරු පහදන්න. (ලකුණු 08)

14. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් **(02)** සඳහා කෙටි සටහන් ලියන්න.

(i) විෂයමාලා සැලසුම් කිරීම සඳහා දර්ශනයේ බලපෑම

(ii) ප්ලේටෝගේ (Plato's) අධ්‍යාපන දර්ශනය හා සමාජය අතර ඇති සම්බන්ධය

(iii) සමාජ වෙනස්වීම අනුව පාසල් විෂයමාලාව වෙනස් නොවීම

(iv) ක්‍රියාකාරකම් විෂයමාලා සංවිධාන ප්‍රවේශය

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

015

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION (NATURAL SCIENCE) DEGREE PROGRAMME**

**LEVEL - 05**

**FINAL EXAMINATION 2018**

**ESU3115 – CURRICULUM THEORY & PRACTICE**

**DURATION – THREE (03) HOURS**

Date: 02.02.2018 Time: 2.00 p.m. – 5.00 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. What do you mean by term "Curriculum"?

02. Briefly explain what is curriculum development model and its importance.

03. Name **five (05)** qualities of a curriculum evaluation.

04. Evaluate the importance of central college curriculum introduced by the Mr. C.W.W. Kannagara in 1938.

05. Define the term "Curriculum Management" and mention **three (03)** stages of Curriculum Management.

06. Mention **three (03)** important principles for curriculum organization which has been pointed out by the National Council for Educational Resources and Training in India and briefly mention the importance of them.

07. Differentiate the terms, "Academic Curriculum" and "Hidden Curriculum".

08. State **five (05)** characteristics of the curriculum evaluation process.

(5 x 8 = 40 marks)

## PART - II

09. i. What do you mean by curriculum development process?

(04 marks)

ii. List out the **four (04)** stages of the curriculum development process which suggested by Tyler.

(08 marks)

iii. Mention **four (04)** determinants of the aims and objectives of the curriculum and evaluate the importance of one of them.

(08 marks)

10. i. Explain the term "needs" and "organized" with special focus on curriculum.

(04 marks)

ii. Explain what are "formative" and "summative" evaluation with regard to the curriculum evaluation process.

(06 marks)

iii. Mention **four (04)** curriculum instruments and examine three (03) features of these evaluation instruments.

(10 marks)

11. i. Evaluate the importance of the curriculum of the ancient period of Sri Lanka.

(04 marks)

ii. Explain briefly about the "Handessa Education System" and examine the strengths and weaknesses of this education system.

(08 marks)

iii. Evaluate the importance of the senior secondary grades curriculum reforms which was done under the 2007 curriculum reforms.

(08 marks)

12. i. What is the necessity of "Curriculum Development Model".

(04 marks)

ii. Mention **four (04)** sources which use to decide the objectives of the Tyler's curriculum development model and explain the importance of them deciding objectives.

(08 marks)

iii. Critically evaluate the Skillbeck's curriculum development model.

(08 marks)

13. i. Mention briefly the relation between psychology and subjects.

(05 marks)

ii. Analyze the importance of Bruner's ideas in preparation of curricula.

(07 marks)

iii. Explain briefly the "Gestalt Theory" and mention how to utilize this theory to be designed a curriculum.

(08 marks)

14. Write short notes on any **two (02)** of the following:

i. Philosophical influences on the planning of a curriculum.

ii. The relationship between Plato's Philosophy education and society.

iii. School curriculum not changed according to social changes.

iv. The activity curriculum organization approach.

(10 x 2 = 20 marks)

*-Copyrights reserved-*